# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### EN 45 E1 රේල්පීලි (45' 00") R 260-EN 13674 -10,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය IFB No- SRS F. 8089

01. ශ්‍රී ලංකාවේ, කොළඹ, තැ.පෙ. 355, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් ස්ථාවර ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින්, ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා EN 45 E1 (45' 00") (13.716M) R 260-EN 13674 **රේල්පීලි 10,000ක්** සැපයීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ලංසුකරුවන්හට තම ලංසු ඇටර්නි බලය පැවරූ පත්කළ නියෝජිතයන් මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක.

02. ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර ලබා ගැනීමත්, ලංසුලේඛන පරීක්ෂාකොට බැලීමත්, පහත සඳහන් ලිපිනයේදී, රාජකාරී දිනවල **2025.06.24 දින සිට 2025.08.05 දින දක්වා පෙ.ව. 9.00 හා ප.ව. 3.00** අතර කාලය තුළ, සතියේ දිනවල සිදුකළ හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත,**
**කොළඹ 10, ශ්‍රී ලංකාව.**

**දුරකථන අංක** : **94(11) 2438078 හෝ 94(11) 4600202**
**ෆැක්ස් අංක** : **94(11)2432044**
**ඊමේල්** : **srs.slr@gmail.com.tender1@railway.gov.lk**
**වෙබ් අඩවිය** : **www.railway.gov.lk**

04. අවශ්‍ය සුදුසුකම්වලට මේවාද ඇතුළත්ය :

ආ) මෙම කොන්ත්‍රාත්තුව යටතේ සැපයුම් කළ යුතු භාණ්ඩ ලංසු ලේඛන සමග නිකුත්කරනු ලබන **RSS 557A** දුම්රිය ගබඩා පිරිවිතරයන්හට අනුකූල විය යුතුය.

ආ) අයිතම සඳහා අදාළවන නිර්මාණ හා නිෂ්පාදනය සඳහා වන ISO 9001: 2008 සහතිකවල පිටපත් මිලගණන් සමග ඉදිරිපත් කළ යුතුය.

ඇ) සුදුසුකම්ලත් ලංසුකරුවන් :

i) සියලුම ලංසුකරුවන් වෙත මෙම කොන්ත්‍රාත්තුව යටතේ වන භාණ්ඩ සැපයීම සඳහා නෛතික හිමිකම සතුවිය යුතුය.

ii) යම් ලංසුකරුවකුහට බැඳියාවන්ගේ පිළිගැටුමක් නොතිබිය යුතුය. එසේ බැඳියාවන්ගේ පිළිගැටුම් සහිත වන ලංසුකරුවන් සුදුසුකම් රහිත බවට සලකනු ලැබේ. එක් හෝ පාර්ශව කිහිපයක් සමග මෙම ලංසුකරණය තුළ එසේ, බැඳියාවන්ගේ පිළිගැටුම් පවත්නා අවස්ථාවන්හිදී ඔවුන්,

අ) දැනට හෝ පසුගිය කාලයේ මෙම ලංසුලේඛන යටතේ මිලදී ගැනීමට නියමිත භාණ්ඩ ප්‍රසම්පාදන සඳහා භාවිත නිර්මාණ සැකසුම, පිරිවිතර හා අනෙකුත් ලේඛන සඳහා උපදේශක සේවා ලබාදීමක් සිදුකොට තිබූ ආයතනයක් හෝ එහි අනුබද්ධිත ආයතනයක් සමග සහයෝගිතාවයෙන් කටයුතු කොට තිබීම, හෝ,

ආ) මෙම ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළ ලංසු එකකට වැඩි ගණනක් ඉදිරිපත් කිරීම කෙසේ වෙතත්, මෙම තත්ත්වය හේතුවෙන් එකකට වඩා වැඩි ගණනක් වූ ලංසු සඳහා උපකොන්ත්‍රාත්කරුවන්ගේ සහභාගිත්වය සීමා නොවේ.

iii) නිෂ්පාදකයන් විසින්, පසුගිය වසර දහය (10) තුළ ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ පදනමින්, අවම වශයෙන් EN 45 E1/ BS 90 (A) රේල්පීලි 5,000ක (වොන් 3,000) තොගයක් සැපයූ භාවිත කළ සංවිධානයක් විසින් නිකුත් කළ කාර්ය සාධන සහතික ඉදිරිපත් කළ යුතුය.

iv) අදළ නිෂ්පාදක/ නිෂ්පාදකවරු විසින්, පසුගිය වසර දහය (10) තුළ EN 45 E1/ BS 90 (A) රේල්පීලි අවම 5,000ක (වොන් 3,000) තොගයක් හා පසුගිය වසර තුන (03) තුළ EN 13674 ප්‍රමිතියේ වෙතත් වොන් 50,000ක දුම්රිය භාණ්ඩ සැපයුම් කරනු ලැබූ බවට තමන්ගේ රටේ රජයෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

05. අ) යම් ලංසුකරුවකු වෙනුවෙන් හෝ සඳහා හෝ යම් අයකුහට උප ඒජන්තවරයකු නියෝජිතයකු, හෝ නම්කළ අයකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය වෙතොත් ඔහු 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ශ්‍රී ලංකාවේ පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වී සිටිය යුතු අතර අදල ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත ලංසු සමග ඉදිරිපත් කළ යුතුය. එසේ එම සහතිකය ඉදිරිපත් නොකරනු ලබන ලංසුකරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

ආ) එසේම, ලංසුකරුවන් විසින්, ලංසු භාරදුන් වහාම හා ප්‍රසම්පාදන ප්‍රදානය කිරීමට පෙරද 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව ලියාපදිංචි වී සිටිය යුතුය. අදළ පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව අදළ ලියාපදිංචි සහතිකය අදළ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් නොකරනු ලබන ලංසුකරුවන් වෙත ප්‍රසම්පාදන ප්‍රදානය කරනු නොලැබේ.

06. මේ සම්බන්ධ පෙර- ලංසු රැස්වීමක් කොළඹ 10, ඩී.ආර්. විජේවර්ධන මාවතේ, ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා වැඩ) කාර්යාලයේදී 2025.07.15 දින පෙ.ව. 10.00 ට පැවැත්වීමට නියමිතය.

07. ආපසු ගෙවනු නොලබන ප්‍රසම්පාදන ගාස්තු රුපියල් 150,000/- හෝ නිදහසේ හුවමාරු කළ හැකි සමාන මුදල් වර්ගයකින් ගෙවීමෙන් හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලය, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව යන ලිපිනයට හෝ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2025.06.24 දින සිට 2025.08.05 දින ප.ව. 3.00 දක්වා (ශ්‍රී ලංකාවේ වේලාවෙන්, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කළ සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදීගත හැක.

08. ලංසු පහත සඳහන් ලිපිනය වෙත 2025.08.06 දින ප.ව. 2.00ට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ස්ථාවර ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,**
**7 වන මහල, සෙත්සිරිපාය,**
**අදියර II, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.**

09. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ ලැබී ඇති ලංසු 2025.08.06 දින ප.ව. 2.00ට ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර II, 7 වන මහල, ප්‍රවාහන මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ විවෘත කිරීමට නියමිතය.

**සභාපති,**
**ස්ථාවර ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,**
**යොමු අංකය** - SRS/F. 8089